නිර්මාණ අඩවිය

ඉඳ හිට දවසක
www.ketapathpawra.com
අඩවියට ගොඩවන්න

ප්‍රතිඥා

මගේ සුසුමක උණුසුමින් ඔබෙ
නෙතේ කඳුලැලි වියැලවන්නම්
ඔබේ දුක් සැහව මැසේ නම්
මගේ කඳුලින් මා හඬන්නම්

බවේ කල පින් මවිය දෙලොවක
මෙදා අප වෙන් වෙලා සිටියට
සදා මේ බැමි අතර සිරවී
මෙලෙස අප දුක් විඳිනු කුමකට

සදා ඉඩදෙමි ඔබට මා හද
පුදා මා ආදරේ ඔබ හට
අතීතයෙ නටඹුන් විතැත් කර
අනාගතයක් මවමු අප ගෙට

රසිකා පෙරේරා

සිහිනයක්

ජීවිතයෙ ගමන් මඟ
දරා නෙක කම්කටොලු
පැමිණි මං පියස දෙස
බලන සඳ විම්සුමෙන්..

දඟකාර, කටකාර
හදවතින් අහිංසක
සිත බඳන, හද රඳන
යම් රුවක මතකයක්
හදවතෙහි රැ ඳුනි නම්..

තුරුණුවිය කෙළි දෙලින්
සැරිසැරුවව උයන් ගැබ
පිපී සුවඳින් පිරුන
දහසකුත් කුසුම්කල
වීහිදවූ සුවඳයෙන්
එක සුවඳ මතකයක්
හදවතෙහි රැ ඳුනි නම්..

උස් හඬින් බස් දොඩන
දෙසවනෙහි ගැටුන සැම
දහසකුත් කටහඬින් එක්
හඬක සොඳුරු බව
හදවතෙහි රැ ඳුනි නම්..

ඒ රුවට, ඒ හඬට
ඔබ සුවඳ කැටිකරන්
ලැගුම්ගෙන හදවතෙහි
සිත පහන් කරවමින්
වසනුයේ සදාකල්
සිහිනයයි පලමු පෙම ..

විජයසිරි තිලකුමාර
ඩ්‍රිස්බේන්

නව ඊද්ම

සිරිලංකෙහි ඉපදී
කල් ගෙවන පෙර කලදී
ගැයූ ගී මොර දී
ගිලිහුනිද මතකයේ නොරැ ඳී

රුවන් වැලි සැයයි
සිරි මහා බෝ සෙවනයි
වැවයි සීගිරියයි
නැවත ලක ඉපදෙන්න කරුණයි

මේ ලෙසින් කාලය
දේශමාතිව ගත වීය
පරණ පින මතු වීය
ඔසී දේසෙට එන්න සිදුවීය

දැන මෙහේ පොලියේ
කාලය ගෙවමු සොම්යේ
පෙර ගැයූ ගීයේ
පදත් අමතක වූ නියායේ

තියෙන ආයුෂ ඊක
ගෙවෙන මතු යම් දවසක
නැවතත් එ-සිරිලක
ඉපදුනොත් කම්මුතුයි නැහැ සැක

ලොකු මහත් වෙන්නයි
උපාදිය ලැබ ගන්නයි
පෝලිමේ ඉන්නයි
යලිත් වීසා ඉල්ල ගන්නයි

එලෙස අවසර ගෙන
ආවත් යලිත් දුව පැන
"ජනසවිය" නැති තැන
රැකෙන්නේ කොලෙසකද සිව මැන

සසර සරනා තුරු
දිනෙක නිවනට යන තුරු
ඔසීලන්තයෙ ගරු
පපමු යලි උපදින්න සුම්තුරු

ශ්‍රාස්ත්‍රපති
හැරිස් පරකන්දෙනිය

It is not you and I

Two figures
Tall and short
Walk down the street
In hand in hand
I look at my hands
They are free
That is not you and I
You are far away

I walk through the park
Stop for a while
Two sit on a bench
Looking at each other
The girl mumbles to him
Getting much closer
I look around me
Those sparkling eyes
Not on me
You are far away

I hurried away
Buried in my thoughts
Someone bumped on me
"Sorry" he gives the way
Shaking the short straight hair
I look at the sky
With niggling fingers
They seek you somewhere
You are far away

I come back home
Stopping day's walk
Hiding in pillows
Weep in silence
Looking at every corner
Touching at every inch
Forcing me to accept
You are far away
But me not be convinced
That you are far away

Sriya Kumarasinghe
New Zealand

මගේ බිමේ හැසෙන්ඩිව...

දෙසවන පිනන සුළු හඬවන මිණි ඊණා
මල් ලොව පුබුදු කරවනු මෙහි බිඟු සේනා
සත් සමුදුරෙහි එපිටත සිට රස ගේනා
අමතනු ඇසෙයි මට නැවතත් සුදු නෙනා

සේපාලිකා මල් ගස අඹියසෙහි හිඳ
තවමත් මුහිදු පිදුමට මල් නෙලනවද
සවසට තුරුළු පැටවුන් අතු අසර හිඳ
නැසෙන්ඩියයගෙ තනියට තනි රකිනවද

පොද වැසි වසින විට වස්සානය එළඹ
මුතුකූඩ ඉලල ඔසවයි සිතිවිලි කළඹ
නදදෙයි මිහිරීතම ලෙස මතකයෙ සළඹ
එන්නම හිතයි නව අවුරුද්දට කොළඹ

මෙල්ඛන් පුරෙන් ඇරඹෙන ලද නව තාලේ
සිංහල ගුවන් විදුලිය අන්තර්ජාලේ
තොරතුරු කියන හැඩි අසුමට අද කාලේ
තුන්මංසලට ගොඩවෙන්නෙමි හැම වේලේ

ලොව දසදෙසින් එන අතහැර තම දේසේ
හැම ජන කොටසටම ඇත නිදහස් වාසේ
සමතැන සැමට ඇත එහි විවරණ නෑසේ
දියුණුවෙ රහස ඒකයි කැන්ගරු දේසේ

නිහිසුනු බෙදුම්වාදය ඔසවන අඩිය
අතු ගා දමන්නට එක ලෙස පා එඩිය
මෙල්ඛන්- -,සිඩ්නි රැ විදුන් රණ හඬ දැඩිය
එක්වුණු සෙනඟ කඳ දහසකට වැඩිය

දෙසිතක පහලවන නිවැරැදි දසුන මත
සෙනෙහස පරම පිවිතුරු ලෙස තිබෙනු ඇත
පුන්සඳ පරිද්දෙන් නැසෙන්ඩියගෙ වත
අපගේ පැතුම් නිවහන එළි කරනු ඇත

උදයට නැගෙන හිරු සවසට බැස යාවි
ගඟපුර දුරුවව ගොස් සුදු සඳ නැග ඒවි
ඒ සඳ ඔඹල මැද හිනැහෙන සඳ හාවි
නැසෙන්ඩියයගෙ තොරතුරු මට පවසාවි

හිම බිමේ අයියන්ඩිව...

සිත ගත සතුටු කරවන සුළු ලෙසින් අද
සංගීතවත් මිහිරක් දෙන පවන් රොද
මේ හැරී මොකද අද දින මා ළඟින් හිඳ
අයියන්ඩියගෙ තොරතුරු මට කියන්නද

මගෙ දින පොතෙහි පිටුවක රැ ඳී හිකිණි මහේ
ගැටුනා පුංචි සටහන නිරතුරුව ඇහේ
අමතක නොවනු ඇත නොසිරිය හමුවූ මෙහේ
කොහොමද උපන් දින සාදය ජයද ඔහේ

ලියුමක් ගමෙන් අවුදින් අම්මගෙ යාල
නැන්දා දිගට විස්තරයක් ලියලාලු
හඳහන් දෙකම හොඳහැරී ගැලපෙනවාලු
අයියගෙ සිතුරු යෝගය මග එනවාලු

අයියන්ඩිගෙන් නිමැවුනු සැලසුම් අනුව
නිවෙසක් සදන්නට සුබ නැකතට කැනුව
ගෙපැලෙහි වැඩට ගොස් හිමිදිරියෙම තැනුව
කෑවෙමු එකට හිඳ කිරිබත් උණු උණුව

සැම සතියකම සරසවියට යන ගානේ
අන්තර්ජාලයට ගොඩවෙමි අවසානේ
වෙබ් අඩවියෙහි"" තුංමංසල"" රජදානේ
රජවරු පිරිස නම් අගයන්නට ඕනේ

සිසු අයිතියට එරෙහිව මහමඟට වැද
ගිනි අවි රැ ගෙන කඳවුරු ඒ අසල බැඳ
පොලිසිය ඔවුන් සමගින් මෙහි කරන යුද
ඔය රටවලත් හරි හරියට තියෙනවද

මිහිදුම් අඳුරු පටසඳ එකිනෙකින් මිදී
රන් හිරු නැගෙනු ඇත රේකා සමග පිදී
ඉන්නට ඔබත් සමගින් සෙනෙහසින් බැඳී
පතනෙමි නැවතත හමුවෙමු මතු දිනයකදී

ජගත් වෙත්තසිංහ

මිලින මල

චන්ද්‍රා සෙනෙවිරත්න
ඕක්ලන්ඩ් නවසීලන්තය

සුවඳ සගවා තවත්
කැකුලක
පැහැයය සිරකර මගේ සිත ලග
වසන්තය පෙනී පෙනී අත ලග
මිලිනවී ගිය සුවඳ මල ඔබ

කැකුල පිපුනා ලගදි දවසක ඔබේ
සුවදයි හැලුනෙ දස අත
මතක සෙනෙහෙක සුවඳ පෙති මත
සැඟව තිබුනා ඔබගෙ හදවත

පිපුනු මල හරි හැඩයි සොඳුරුයි
සියල් දන සිත් පුබුදුවාලයි
මිහිරී මතකය හිතට සුවදයි

කොතැනකද සැඟවුණේ

නුඹ ගගනා සීනා යළි අරන් ගිහින්
සිත පෙළා දමා නුඹ දුරක ගිහින්
මට සිනා ගන්න බැරි ශොකක දමා
නුඹ සිනාසන්නත් කෙළසකද කියන්

සියපතින් දිදුළ වීළක් හරි හැඩයි
ගඟ වැළඳ ලොවක තුරීත් නිදයි
චන්ද්‍රා අරුණක සුව සිතට දෙමින්
මා ළය බැඳලුත් නුඹ කොහෙද ගිහින්

ධම්ම විජේසිංහ
කැනඩාව.

මුතු කූඩ

සිරි සිරි ගා වැටෙන වැහි තුඩඟ
හෝ හෝ හඬින් ගිනියම් සුළඟ
රත් රත් රුවින් ගල හිරු පළඟ
වෙමි සෙවන මම මිතුරු මුතු කූඩය

දැක්මෙන් සුන්දරයි මතු පිටම
ලියකම් වර්ණ පුරවා ගතම
හිස ඉහළ යන දනා දුක් ගඟ ම
කලුළු වී ගැලුවෙ හිස අද්දරම

සෙනෙහසින් දරු පැටවී ඔසවාම
දූවිල්ල දහදියෙද කැන්දාම
දිදී මව්ගෙ හිස් මුදුනෙ හැඹදාම
ගියා හිත් ලේ කිරට හරවාම

හිරිකඩෙන් සයුරු රැල් වදින සඳ
පෙම්බසින් දොඩමළු වූ සකි සබඳ
වෙන්වෙලා විරහවෙන් යනවිටද
වෙන්වුනේ නැත මෙමා නිති හිඬඳ

වක ගැසී රැළි වැටී සුදු හිසේ
මා ගියේ වෙව්ලමින් ඇඟෙ අතේ
ඉරනාට කැඩුනාට ජීවිතේ
තුරුළු වී යමිය රළු මාවතේ

අහස් ගැබ කළු කරන් ගුගුරාන
එන විටදි යන ගමන අවසාන
ගොළුවෙලා ගියත් සකි සඳපාන
හිඳිමි මම නුඹ අසල හැඹදාම

ලක්ෂ්මන් කොඩිතුවක්කු

ආදර්ශ

ආදරය යන අකුරු සතරට
කොයි තරම් අරුතක්
තිබේවිද
මල් පියලි පුබුදුවන පොළවට
නැවුම් වැස්සක් සේ වසීවිද
පහන් තරුවක් විලස
දිලෙමින්
ඇත අහසේ මග කියාවිද
කටු අතුල් මත පිපුනු
කුසුමක
පිනි සිඹින ලා හිරුම ඒවිද
හදේ දොරගුළු පියන්පත්
හැර
සිතුම් බිතුසිතුවම් ඇඳිවිද
සිතුම් උදුරා පැතුම් වනසා
කුණාටුවකට මග කියාවිද....?

විද්‍යානි මනතුංග

Disney Maintenance DM
INDUSTRIAL COMMERCIAL DOMESTIC
CARPET STEAM CLEANING - HARD FLOOR CLEANING & SEALING
Disney Maintenance
Rohan Tel: 03 9792 0656 Mob: 0408 106 022